සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2021 ජූලි

## (301) මූල්‍ය වාර්තාකරණය

(Financial Reporting)

2021-10-23
පෙරවරු
[08.45 – 12.00]

පිටු ගණන : 11
ප්‍රශ්න ගණන : 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

ව්‍යාපාර තීරණ ගැනීමේදී මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ලැයිස්තුගත සමාගමක වාර්ෂික වාර්තාවක ඇතුළත් මූල්‍ය නොවන තොරතුරු තුනක්(03) **ලැයිස්තුගත කරන්න.**
(ලකුණු 03)

(b) සංකලිත වාර්තාකරණයේ (Integrated Reporting) ප්‍රධාන අරමුණ (key objective) **සඳහන් කරන්න.** (ලකුණු 02)
(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 1987 වර්ෂයේදී පිහිට වූ අතර, එය කොළඹ කොටස් හුවමාරුවේ ප්‍රධාන නියාමන මණ්ඩලය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.**
(ලකුණු 02)

(b) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ වගකීම් සහ කාර්යයන් තුනක්(03) **සඳහන් කරන්න.**
(ලකුණු 03)
(මුළු ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක ආකෘතිමය රාමුව, මූල්‍ය වාර්තාකරණයේ අරමුණු, ප්‍රයෝජනවත් මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ, මූලිකාංග නිර්වචනය, හඳුනා ගැනීම හා මැනීම සහ ප්‍රාග්ධනය හා ප්‍රාග්ධනය නඩත්තු කිරීම යන සංකල්පයන්ට අදාලව කටයුතු කෙරේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) “මූල්‍ය ප්‍රාග්ධනය නඩත්තු කිරීම පිළිබඳ සංකල්පය”, “භෞතික ප්‍රාග්ධනය නඩත්තු කිරීම පිළිබඳ සංකල්පයෙන්”. **වෙනස්කොට දක්වන්න.** (ලකුණු 03)

(b) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගන්නා උපකල්පනය **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයෙක් වන **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම,** කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කරමින් 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත.

කෙසේවෙතත්, එම මූල්‍ය ප්‍රකාශනවලට අදාලව පහත සඳහන් දෑ නිරීක්ෂණය විය:

(1) ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අදාල වන ණය ගැනුම් පිරිවැය, එම ගොඩනැගිල්ලේ පිරිවැයට ප්‍රාග්ධනීත කර ඇත.

(2) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන්නෙන් අඩු වටිනාකමට තොග අගය කර ඇත.

(3) කාර්යාල උපකරණවල ඵලදායී ජීව කාලය වර්ෂය තුළදී වෙනස් කර තිබුණි. මෙහි බලපෑම අතීතානුයෝගීව (retrospectively) පෙර කාල පරිච්ඡේද සඳහා ගැලපීම් සිදුකර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් [Small and Medium Enterprises (SMEs)] සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව ඉහත සඳහන් එක් එක් දැහි ගිණුම්කරණය සිදුකරන ආකාරයේ වලංගුභාවය **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# <u>B කොටස</u>

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත එන්රිච් ෆුඩ්ස් (පෞද්ගලික) සමාගමේ** 2021 මාර්තු 31 දිනට සහ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පහත සඳහන් පරිදි වේ:

**සීමාසහිත එන්රිච් ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| මාර්තු 31 දිනට | 2021 | 2020 |
|---|---|---|
| **වත්කම්:** | | |
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 18,500 | 14,000 |
| සමුච්චිත ක්ෂය | (3,250) | (2,200) |
| **ධාරණ අගය** | **15,250** | **11,800** |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 3,100 | 3,800 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,700 | 2,240 |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 500 | 2,100 |
| | **6,300** | **8,140** |
| **මුළු වත්කම්** | **21,550** | **19,940** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| **ස්කන්ධය:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 10,000 | 10,000 |
| රඳවාගත් ඉපැයීම් | 4,200 | 2,700 |
| | **14,200** | **12,700** |
| **ජංගම නොවන වගකීම්:** | | |
| දිගුකාලීන ණය | 2,050 | 2,450 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම) | 2,400 | 2,100 |
| | **4,450** | **4,550** |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 2,020 | 1,640 |
| කෙටිකාලීන ණය | 250 | 250 |
| ගෙවිය යුතු පොලී | 220 | 380 |
| ගෙවිය යුතු ආදායම් බදු | 410 | 420 |
| | **2,900** | **2,690** |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | **21,550** | **19,940** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළදී සමාගම විසින් ඉඩමක් අත්පත් කර ගත් අතර, දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් වෙනත් කිසිදු මිලදී ගැනීමක් හෝ ඉවත් කිරීමක් සිදුකොට නොමැත.

(2) වර්ෂයට අදාල ණය පොලී වියදම රු.300,000/- කි.

(3) වර්ෂය තුළදී, සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා අතුරු ලාභාංශ වශයෙන් රු.200,000/- ක් ගෙවන ලදී.

(4) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් බදු වියදම රු.190,000/- කි.

(5) වර්ෂය තුළදී කිසිදු පාරිතෝෂික ගෙවීමක් සිදුකොට නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත එන්රිච් ෆුඩ්ස් (පෞද්ගලික) සමාගමේ** මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය යටතේ **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත මැක්‍රෝ ටෙක්නොලොජීස් සමාගම (MTL),** බහුකාර්ය මෘදුකාංග විකිණීමේ සහ නඩත්තු සේවා සැපයීමේ නිරතව සිටී. 2020 අප්‍රේල් 01 දින, **MTL** සමාගම විසින් රු.600,000/- කට, වසර 2 ක සේවා නඩත්තු සේවය සමඟ තොග කළමනාකරණ මෘදුකාංගයක් සැපයීම සඳහා **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගම** සමඟ ගිවිසුමකට එළැඹිණි. මෙම මෘදුකාංගය සහ සේවා නඩත්තුව වෙන් වෙන්ව සපයන්නේ නම්, මෘදුකාංගයේ වෙළෙඳපොළ මිල රු.300,000/- ක් වන අතර, මාසික නඩත්තු සේවා ගාස්තුව රු.10,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 (SLFRS 15) - ගනුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය ප්‍රමිතයට අනුව 2021 මාර්තු 31 සහ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා **MTL** සමාගමේ අයභාරය හඳුනාගැනීමට අදාල වන ගිණුම්කරණ සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 06)

(b) 2020 අප්‍රේල් 01 දිනට **සීමාසහිත සංඛ සමාගමේ** පොත්වල පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කරන ලදී:

| | **රු.** |
|---|---|
| යන්ත්‍ර ගිණුම | 10,000,000 |
| සමුච්චිත ක්ෂය - යන්ත්‍ර | 4,000,000 |

ඉහත යන්ත්‍ර ගිණුම තුළ අඩංගුව ඇත්තේ එක් යන්ත්‍රයක් පමණකි. එය මිලදී ගන්නා අවස්ථාවේදී එහි ඵලදායී ජීව කාලය වර්ෂ 10 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත. කෙසේවෙතත්, 2020 අප්‍රේල් 01 දින යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය පිළිබඳ සමාලෝචනය කිරීමේදී එදිනට එහි ඉතිරි ඵලදායී ජීවකාලය වසර 8 ක් බව අනාවරණය විය. **සීමාසහිත සංඛ සමාගම** එහි යන්ත්‍ර, පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 (LKAS - 08) - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම සහ වැරදි ප්‍රමිතයට අනුව 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා යන්ත්‍රයේ ක්ෂය අයකිරීම **ගණනය කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## **07** වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 23 (LKAS - 23) - ණය ගැනුම් පිරිවැය ප්‍රමිතයට අනුව "සුදුසුකම් ලබන වත්කමක්" යන පදය, සුදුසුකම් ලබන වත්කම් සඳහා උදාහරණ දෙකක්(02) සහිතව **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) 2020 ජූලි 01 දින, **සීමාසහිත සල්මා සමාගම,** නව කර්මාන්තශාලා ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කරන ලදි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා සමාගම විසින් 2020 අප්‍රේල් 01 දින එකක් රු.100/- බැගින් වූ ණයකර 100,000 ක් නිකුත් කරනු ලැබිය. මෙම ණයකර සඳහා වාර්ෂිකව 10% ක පොලී අනුපාතිකයක් යටතේ වාර්ෂිකව පොලිය ගෙවිය යුතු වේ.

ඊට අමතරව, මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාගම විසින් 2020 අප්‍රේල් 01 දින **ABC බැංකුවෙන්** වර්ෂ 10 කින් ගෙවා නිම කළ යුතු වාර්ෂික පොලී අනුපාතය 12% ක් වූ රු. මිලියන 5 ක ණය මුදලක් ලබාගෙන ඇත. මෙම ණය මුදලේ ණය ප්‍රාග්ධනය ආපසු ගෙවීම ආරම්භ වනුයේ වසරක සහන කාලයකින් පසුව වේ.

2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී, සමාගම විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.12,000,000/- ක් දරා ඇති අතර, 2021 මාර්තු 31 දිනට ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පැවතුණි. ණයමුදලෙන් සහ ණයකර නිකුතුවෙන් ලද ඉතිරි මුදල් තාවකාලික පදනමින් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළ අතර, මෙමගින් වර්ෂය තුළදී රු.160,000/- ක පොලී ආදායමක් උපයනු ලැබිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2021 මාර්තු 31 දිනට ගොඩනැගිලි නොනිමි [Work-in-Progress (WIP)] ගිණුමේ ප්‍රාග්ධනිත කළ යුතු ණය ගැනුම් පිරිවැය **ගණනය කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත නයීන් සමාගමේ** පොත්වලින් 2021 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම උපුටාගෙන ඇත:

**සීමාසහිත නයීන් සමාගම**
**2021 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| | හර | බැර |
|---|---|---|
| **දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට:** | | |
| ඉඩම සහ ගොඩනැගිල්ල (ඉඩමේ පිරිවැය - රු. මිලියන 25) | 37,500 | |
| පිරියත සහ යන්ත්‍ර | 6,250 | |
| මෝටර් වාහනය | 9,600 | |
| **2020 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය:** | | |
| ගොඩනැගිල්ල | | 7,500 |
| පිරියත සහ යන්ත්‍ර | | 3,750 |
| මෝටර් වාහනය | | 5,000 |
| 2021 මාර්තු 31 දිනට තොගය | 8,920 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 14,180 | |
| අත්තිකාරම් ගිණුම | 2,806 | |
| ඉදිරියට කළ ගෙවීම් | 1,200 | |
| අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 805 | |
| බැංකු ණය | | 3,600 |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂික සඳහා වෙන්කිරීම්) | | 1,250 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 6,800 |
| 2020 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බදු | | 720 |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදනය | | 3,000 |
| මෝටර් රථය විකිණීමෙන් ලද මුදල | | 4,500 |
| විකුණුම් පිරිවැය / විකුණුම් | 67,760 | 100,400 |
| අධ්‍යක්ෂ ගාස්තු | 1,200 | |
| විගණන ගාස්තු | 270 | |
| වෙනත් පරිපාලන වියදම් | 10,240 | |
| බෙදාහැරීමේ වියදම් | 7,210 | |
| පොලී වියදම් | 718 | |
| ගෙවූ ආදායම් බදු | 2,000 | |
| ගෙවූ අතුරු ලාභාංශ | 1,000 | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 700,000) | | 7,000 |
| 2020 අප්‍රේල් 01 දිනට රඳවාගත් ඉපැයීම් | | 28,139 |
| | **171,659** | **171,659** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) දේපළ, පිරියත සහ උපකරණ, පිරිවැය මත, සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන අතර, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි වේ:

| | | |
|---|---|---|
| ගොඩනැගිලි | : | වර්ෂ 50 |
| පිරියත සහ යන්ත්‍ර | : | වර්ෂ 05 |
| මෝටර් වාහන | : | වර්ෂ 05 |

(2) ගිණුම් පොත්වල පිරිවැය ලෙස රු. මිලියන 9.6 ක් ලෙස සඳහන් වන මෝටර් රථය 2020 දෙසැම්බර් 31 දින රු. මිලියන 4.5 කට විකුණන ලදි. මෝටර් රථය විකිණීමෙන් ලද මුදල් සටහන් කිරීම හැර අනෙකුත් සටහන් ලෙජර් ගිණුම්වල වාර්තාකොට නොතිබුණි. මෙම මෝටර් රථය විකිණීමෙන් ලද මුදල, මෝටර් රථය විකිණීමෙන් ලද මුදල් ගිණුමේ වාර්තා කොට ඇත.

(3) 2020 අප්‍රේල් 01 දින, මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ නව මෝටර් රථයක් මිලදීගෙන තිබුණි. කල්බදු ක්‍රමයට ලබාගත් මෝටර් රථයේ සාධාරණ අගය රු. මිලියන 5 ක් වන අතර, කල්බදු කාල සීමාව වර්ෂ 5 කි. වාර්ෂික කල්බදු වාරිකය රු.806,000/- ක් වන අතර, එය සෑම වර්ෂයකම මාර්තු 31 දින ගෙවිය යුතු වේ. කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතය 11% ක් වේ. කල්බදු කාලසීමාවෙන් පසුව මෝටර් රථයේ හිමිකාරීත්වය **සීමාසහිත තයින් සමාගමට** හිමිවේ. මේ සඳහා කරන ලද මූලික ගෙවීම වන රු. මිලියන 2 සහ ගෙවනු ලැබූ පළමු කල්බදු වාරිකය වූ රු.806,000/- ක මුදල, අත්තිකාරම් ගිණුමේ වාර්තා කර ඇත. ඊට අමතරව මේ සම්බන්ධයෙන් වෙනත් සටහනක් ගිණුම් පොත්වල සිදුකර නොමැත.

(4) 2021 සම්පූර්ණ ලිත් වර්ෂය සඳහා ගෙවනු ලැබූ කුලිය, ඉදිරියට කළ ගෙවීම් ගිණුම තුළ අඩංගු වේ. මාසික කුලිය රු.100,000/- කි.

(5) පහත සඳහන් වියදම්, 2021 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල උපචිත / ප්‍රතිපාදන කර නොමැත:

- 2021 මාර්තු මාසයට අදාල අන්තර්ජාල සහ දුරකතන බිල්පත් - රු.55,000/-
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම් - රු.500,000/-

(6) 2021 මාර්තු 31 දිනට පවතින බැංකු ණය ගිණුමේ ශේෂයෙන් ½ ක් 2021/22 වර්ෂය තුළදී ගෙවා නිම කළ යුතුය.

(7) 2021 මාර්තු 31 දිනට, දින 360 කට වඩා කල් ඉකුත් වූ රු. මිලියන 2.5 ක් හිඟව ඇති ගනුදෙනුකරුවෙක් සිටී. මෙම මුදල සඳහා දැනටමත් ගිණුම් පොත්වල ප්‍රතිපාදන සිදුකොට ඇත. කෙසේනමුත්, එම ගනුදෙනුකරුවා විසින් එම මුදලෙන් රු. මිලියන 2.2 ක් 2021 අප්‍රේල් මාසයේදී පියවූ අතර, ඉතිරි මුදල බොල්ණය ලෙස 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ලියා හැරීමට සමාගම තීරණය කොට ඇත.

(8) 2020/21 තක්සේරු වර්ෂයට අදාල ආදායම් බදු වගකීම, රු. මිලියන 1.5 ක් ලෙස ඇස්තමේන්තුගතකොට තිබේ.

(9) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2021 මැයි 30 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයෙන්, **සීමාසහිත තයින් සමාගමේ** පහත සඳහන් දෑ, **පිළියෙල කරන්න**:

(a) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභා'ලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය (විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය). (ලකුණු 10)

(b) 2021 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(c) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 02)

(d) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණවල වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සීමාසහිත සින්දු සමාගමේ** සහ **සීමාසහිත බින්දු සමාගමේ** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශ පහත සඳහන් පරිදි වේ:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශ** *(රු.'000)*

| | **සීමාසහිත සින්දු සමාගම** | **සීමාසහිත බින්දු සමාගම** |
|---|---|---|
| විකුණුම් | 57,400 | 13,602 |
| විකුණුම් පිරිවැය | (36,200) | (7,248) |
| **දළ ලාභය** | **21,200** | **6,354** |
| **වෙනත් ආදායම්:** | | |
| උපදේශන සේවා ආදායම | 300 | - |
| වෙනත් ආදායම් | 1,200 | 1,000 |
| **වියදම්:** | | |
| බෙදාහැරීමේ වියදම් | (7,200) | (1,170) |
| පරිපාලන වියදම් | (4,680) | (2,580) |
| මූල්‍ය වියදම් | (690) | (210) |
| **බදු පෙර ලාභය** | **10,130** | **3,394** |
| ආදායම් බදු | (180) | (30) |
| **වර්ෂය සඳහා ලාභය** | **9,950** | **3,364** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2020 අප්‍රේල් 01 දින **සීමාසහිත සින්දු සමාගම** විසින් **සීමාසහිත බින්දු සමාගමේ** සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 80% ක් රු. මිලියන 42 කට අත්පත් කරගන්නා ලදී. එදිනට **සීමාසහිත බින්දු සමාගමේ** හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සාධාරණ අගය රු. මිලියන 45 ක් වූ අතර, පාලනය නොවන හිමිකමේ සාධාරණ අගය රු. මිලියන 6 ක් විය.

(2) වර්ෂය තුළදී, **සීමාසහිත බින්දු සමාගම** විසින් **සීමාසහිත සින්දු සමාගමට** රු. මිලියන 8 ක පිරිවැය වූ භාණ්ඩ, පිරිවැය මත 25% ක ලාභ ආන්තිකයක් සහිතව විකුණන ලදී. 2021 මාර්තු 31 දිනට **සීමාසහිත සින්දු සමාගමේ** ගබඩාවේ රු. මිලියන 4 ක වටිනාකමින් යුක්ත වූ තොගයක් නොවිකිණී තිබුණි.

(3) වර්ෂය තුළදී, **සීමාසහිත සින්දු සමාගම** විසින් මාසිකව රු.25,000/- බැගින් අයකරගෙන **සීමාසහිත බින්දු සමාගම** වෙත උපදේශන සේවා ලබාදී ඇත.

(4) 2020 අප්‍රේල් 01 දින, **සීමාසහිත බින්දු සමාගම** විසින් **සීමාසහිත බින්දු සමාගමේ** පොත්වල එදිනට ධාරණ අගය රු.3,000,000/- ක් ව පැවති යන්ත්‍රයක් රු.4,000,000/- කට **සීමාසහිත සින්දු සමාගමට** විකුණන ලදී. 2020 අප්‍රේල් 01 දිනට එම යන්ත්‍රයේ ඉතිරි ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඒකාබද්ධ කිරීමේදී ඇතිවූ කීර්තිනාමය **ගණනය කරන්න**. (ලකුණු 04)

(b) 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය **පිළියෙල කරන්න**.

(ලකුණු 09)
(මුළු ලකුණු 13)

## 10 වන ප්‍රශ්නය

**සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගමේ** පොත්වලින් 2020/21 සහ 2019/20 වර්ෂ සඳහා පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන උපුටාගෙන ඇත:

**සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගම**
**2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

| | රු.'000 |
|---|---|
| විකුණුම් | 378,500 |
| විකුණුම් පිරිවැය | (265,900) |
| **දළ ලාභය** | 112,600 |
| වෙනත් ආදායම් | 14,650 |
| | 127,250 |
| **වියදම්:** | |
| බෙදාහැරීමේ වියදම් | (24,780) |
| පරිපාලන වියදම් | (49,540) |
| මූල්‍ය වියදම් - ණය පොලී | (8,200) |
| **බදු පෙර ලාභය** | **44,730** |
| ආදායම් බදු | (950) |
| **වර්ෂය සඳහා ලාභය** | **43,780** |

**සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගම**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශන** *(රු.'000)*

| | 2021 මාර්තු 31 දිනට | | 2020 මාර්තු 31 දිනට | |
|---|---|---|---|---|
| **වත්කම්:** | | | | |
| **ජංගම නොවන වත්කම්:** | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ අගයට | | 169,800 | | 100,500 |
| **ජංගම වත්කම්:** | | | | |
| තොගය | 29,000 | | 32,500 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 39,000 | | 38,200 | |
| වෙනත් ලැබිය යුතු මුදල් | 2,500 | | 3,000 | |
| මුදල් සහ මුදල්වලට සමාන දෑ | 4,200 | 74,700 | 18,500 | 92,200 |
| **මුළු වත්කම්** | | **244,500** | | **192,700** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | | | |
| **ස්කන්ධය:** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 90,000 | | 90,000 | |
| රඳවාගත් ඉපැයීම් | 78,000 | 168,000 | 39,500 | 129,500 |
| **ජංගම නොවන වගකීම්:** | | | | |
| දිගු කාලීන ණය | 18,000 | | 12,000 | |
| සේවක ප්‍රතිලාභ | 16,500 | 34,500 | 20,500 | 32,500 |
| **ජංගම වගකීම්:** | | | | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 34,000 | | 29,600 | |
| ගෙවිය යුතු ආදායම් බදු | 500 | | 400 | |
| උපචිත වියදම් | 7,500 | 42,000 | 700 | 30,700 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **244,500** | | **192,700** |

2020/21 වර්ෂය සඳහා පහත සඳහන් කර්මාන්තයේ සාමාන්‍යයන් ද (industry averages) හඳුනාගෙන ඇත:

| | |
|---|---|
| දළ ලාභ අනුපාතය | 35% |
| ශුද්ධ ලාභ අනුපාතය | 12% |
| ජංගම අනුපාතය | 2.5 : 1 |
| ණයගැති එකතුකිරීමේ කාලය | දින 45 |
| තොග නේවාසික කාලය | දින 40 |
| පොලී ආවරණ අනුපාතය | වාර 5 |

සියලුම විකුණුම් ණය පදනම මත සිදුකරන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව, 2021 මාර්තු 31 දිනට / දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් අනුපාත **ගණනය කරන්න**:

(i) දළ ලාභ අනුපාතය.

(ii) ශුද්ධ ලාභ අනුපාතය.

(iii) ජංගම අනුපාතය

(iv) ණයගැති එකතුකිරීමේ කාලය.

(v) තොග නේවාසික කාලය.

(vi) පොලී ආවරණ අනුපාතය. (ලකුණු 06)

(b) ඉහත හඳුනාගන්නා ලද කර්මාන්තයේ සාමාන්‍යයන් සැලකිල්ලට ගනිමින්, **සීමාසහිත ඇලෙක්ස් පොදු සමාගමේ** 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා / අවසන් දිනට කාර්යසාධනය **විශ්ලේෂණය කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 12)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |